# අතුරලිය ප්‍රාදේශීය සභාව.

## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය පකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව අතුරලිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට අතුරලිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2005 දෙසැම්බර් 01 දිනැති අංක 1421/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව අතුරලිය ප්‍රාදේශීය සභාව ස්ථාපනය කර තිබුණද 2013 මැයි 22 විගණන පරීක්ෂණ දින වන විටත් අකුරැස්ස ප්‍රාදේශීය සභාව සහ අතුරලිය ප්‍රාදේශීය සභාව අතර වත්කම් හා වගකීම් බෙදාහැරීම් නිරවුල් කර ගෙන නොතිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයකින් මාර්ග තලනයක් මිළදී ගැනීම සඳහා සභා අරමුදලන් දැරීමට අපේක්ෂිත වියදම වන රු.1,000,000 ක මදල සඳහා ජර්නල් සටහන් අංක 36 මගින් දෙවරක් වැය ගිණුම හරකර ණයහිමියෝ බැර කිරීම නිසා එම ප්‍රමාණයෙන් එකී ගිණුම් ශේෂ වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ග්‍රාමීය මාර්ග වැඩ සටහන (මගනැගුම) යටතේ 2012 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර වැඩ නිමකර තිබූ කර්මාන්ත 06 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී මුදල් ගෙවීමට තිබූ අතර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ඒ සඳහා මුදල් ලැබීමටද නියමිතව තිබුණි. මේ අනුව එකී කර්මාන්ත සඳහා රු.3,000,000 ක් වටිනා ණයහිමි හා ණයගැති ප්‍රතිපාදන සලසා ගිණුම් ගැලපීම මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණ.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

පාලන ගිණුම අනුව ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන්ගේ වටිනාකම රු.1,232,537 ක් වූ අතර, උපයෝගී ලේඛණ අනුව ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.1,139,479 ක් වූයෙන් රු.93,058 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 නිරවුල් නොකල ගිණුම්

ඉදිරියට ගෙන එමින් පැවති වර්ෂ 05 කට වඩා පැරණ රු.97,296 ක් වූ වගකීම් ගිණුම් 05 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.7,786,458 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,428,210 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,576,953 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසන් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් බදු | 888 | 812 | 429 |
| (ii) | බදු කුලී | 16,440 | 1,429 | 159 |
| (iii) | වෙනත් ආදායම් | 3,513 | 4,611 | 1,831 |

2.2.2 වරිපනම් බදු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ පාරිභෝගික ස්ථාන 80 කින් වර්ෂයකට අධික කාලයක් තිස්සේ හිඟහිටි වරිපනම් බදු මුදල රු.214,542 ක් විය. හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) උප වගන්තිය ප්‍රකාර කටයුතු කිරීමට සභා ලේකම්වරයා අපොහොසත් වී තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු ලේඛණයහි ඇතුළත් වූ වරිපනම් බදුකරුවන් 31 දෙනෙකුගේ නම් 2012 වර්ෂයට අදාල වරිපනම් බදු ලේඛණයේ ඇතුළත් වී නොතිබූ බව නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ අතර ඔවුන්ගෙන් 2011 වර්ෂයට අයවිය යුතු හිඟ වරිපනම් බදු මුදල රු.7,063 ක් විය.

2.2.3 බදු කුලී

සභාව සතු කඩ කාමර තුනකින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.23,870 ක මුදලක් හිඟහිට තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.253,384 ක මුදලක්ද, මුද්දර ගාස්තු වශයෙන් රු.5,743,142 ක මුදලක්ද ලැබිය යුතුව තිබුණි.

2.2.5 ව්‍යාපාරික ස්ථාන බලපත්‍ර

(අ) අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂයේදී ව්‍යාපාර ස්ථාන 45 කට අදාලව ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතික ලබාදී තිබුණි. මෙම ව්‍යාපාරික ස්ථාන වලින් ප්‍රාදේශීය සභාව වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සභා අරමුදලට රු.45,000 ක පාඩුවක් සිදුව තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 213 වන වගන්තිය ප්‍රකාරව වෙළඳ බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාරික ස්ථාන හඳුනාගෙන ඒවාට එරෙහිව මාස 06 ක් තුල නඩු පවරා අදාල ගාස්තු අයකර ගතයුතු වුවත් 2012 වසර වෙනුවෙන් එවැනි නඩු පැවරීමක් සිදුකර නොතිබුණි.

2.3 අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) උප වගන්තිය පරිද සභාවේ සුභසාධනය සඳහා හෝ සභා නිලධාරීන්ට යම් ආපදාවක් ඇති වූ විට හෝ ඔවුන්ට සහන සැලසීමේ අරමුණින් පිහිටුවා ගත් සංස්ථාපනය කරන ලද අරමුදලකට සභාව තීරණය කරන ලද මුදලක් ප්‍රදානය කළ හැකි වුවද එලෙස සංස්ථාපනය නොකළ සුභ සාධක සමිතියක් වෙත සමාලෝචිත වර්ෂයේදී රු.100,000 මුදලක් සභා අරමුදලින් ප්‍රදානය කර තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(i) ජේදය ප්‍රකාරව තනතුර ඇතිකිරීම හා වැටුප් නියම කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලියවිල්ලකින් අනුමැතිය කලින් ලබා ගැනීමට යටත්ව නිලධාරීන් සභා කාර්යයන් සඳහා යොදවා ගත යුතු නමුත් සභාවේ සේවයේ නියුතු ආදේශකමුරකරු සඳහා එවැනි අනුමැතියකින් තොරව සේවයේ යොදවාගෙන වැටුප් වශයෙන් රු.182,082 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 07 දිනැති දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව අනුමත කාර්ය මණ්ඩලය තුල වැඩ පර්පාලක තනතුරක් සඳහා සභාවට අනුමැතිය දී නොතිබුණ ද ඒ සඳහා ස්ථිර සේවකයෙකු යොදවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.302,097 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඈ) 2013 අප්‍රේල් 22 දිනැති අංක 1807/02 දරන ප්‍රධාන අමාත්‍යවරයාගේ ගැසට් පත්‍රය අනුව ගමන් වියදම් ගෙවීමට අදාල රීති පද්ධතියට අනුව සභාව විසින් හෝ මහජන නියෝජිතයා වශයෙන් තමාට පැවරි

ඇති කාර්යයන් සඳහා පමණක් සභිකයින්ට ගමන් වියදම් දීමනාව ගෙවිය යුතු වුවද එලෙස කිසිදු කාර්ය පැවරීමකින් තොරව අවස්ථා 22 කදී රු.60,000 ක මුදලක් සහා මන්ත්‍රීවරුන්ට සමාලෝචිත වර්ෂයේදි ගෙවා තිබුණි.

2.4 කොන්ත්‍රාත් පරිපාලනය

සහා බල ප්‍රදේශයේ 2012 වර්ෂයේ ක්‍රියාත්මක ව ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන (මගනැගුම) යටතේ ඉදිකර තිබූ මාර්ග පිළිබඳව 2013 මැයි 28 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) විල්පිට සිට පිටගොඩැල්ල හරහා පනුගල්දෙනිය මාර්ගය සංවර්ධනය කිරීම - රු.551,971

- ඇස්තමේන්තුවේ විෂය අංක 06 පරිදි මාර්ගය දෙපස උරහිස් වලට පස් ඇතිරීම සිදුකර නොතිබියදී එම කාර්යය වෙනුවෙන් ඝනමීටර් 4.85 ක් සඳහා රු.2,772 ක මුදලක් ගෙවා තිබුණි.
- සාමාන්‍යයෙන් මාර්ගය දෙපස ෂටරින් යෙදීම එකවර සිදුනොකරන අතර එය සිදුකරනුයේ කොටසින් කොටසය. නමුත් මෙම මාර්ගයේ එම කාර්යය එකවර සිදුකර ඒ සඳහා වර්ග මීටර් 41.76 කට රු.17,414 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) ඉඹුල්ගහහේන වත්ත පාර සංවර්ධනය කිරීම - II වන අදියර - රු.500,000

- ඇස්තමේන්තුවේ විෂය අංක 06 පරිදි මාර්ගයේ උරහිස් වලට අනුමත පස් ඇතිරීම සිදුකර නොතිබියදී එම කාර්යය වෙනුවෙන් ඝණ මීටර් 18 ක් සඳහා රු.10,232 ක් ගෙවා තිබුණි.
- සාමාන්‍යයෙන් මාර්ගය දෙපස ෂටරින් යෙදීම එකවර සිදුනොකරන අතර එය සිදුකරනුයේ කොටසින් කොටසය. නමුත් මෙම මාර්ගයේ එම කාර්යය එකවර සිදුකර ඒ සඳහා වර්ග මීටර් 34.68 කට රු.10,750 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) සියඹලාගොඩ පාරේ අන්ගුන්න ගොඩ මාර්ගය II අදියර - රු.681,836

- ඇස්තමේන්තුවේ අයිතම අංක 09 පරිදි මාර්ගයේ උරහිස් වලට පස් සපයා ඇතිරීම සිදුකර නොතිබියදී එය සිදුකර ඇති බව සඳහන් කරමින් ඝණ මීටර් 54.89 ක් සඳහා රු.28,645 ක මුදලක් ගෙවා තිබුණි.
- සාමාන්‍යයෙන් මාර්ගය දෙපස ෂටරින් යෙදීම එකවර සිදුනොකරන අතර එය සිදුකරනුයේ කොටසින් කොටසය. නමුත් මෙම මාර්ගයේ එම කාර්යය එකවර සිදුකර ඒ සඳහා වර්ග මීටර් 49.05 කට රු.28,645 ක මුදලක් ගෙවා තිබුණි.

2.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සභාවේ නිලධාරීන් තිදෙනෙකුට හිඟ වැටුප් වශයෙන් රු.111,840 ක මුදලක් සහා අරමුදලින් ගෙවා තිබුණද එම මුදල පළාත් පාලන කොමසාරිස් වෙතින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

---

(ආ) ලංකා විදුලි බල මණ්ඩලය විසින් සභා බල ප්‍රදේශය සඳහා වීථි පහන් 57 ක් අනුමත කර තිබුණ ද 2012 වර්ෂයේදී ප්‍රදේශය තුල විථි පහන් 374 ක් සවිකර තිබුණි. මෙලෙස වීථි පහන් සවි කිරීම පිළිබඳව සභාවට වාර්තා වී නොතිබුණි.

(ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි. 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛණයක් නොතිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය